www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව සහ එල්ටීටීඊය සාකච්ඡා සඳහා එකඟ වේ

## Sri Lankan government and LTTE agree to hold talks

**සරත් කුමාර විසිනි**
**2006 ජනවාරි 30**

සැලකිය යුතු මට්ටමක ජාත්‍යන්තර පීඩනයකින් පසුව, පසුගිය බදාදා ශ්‍රී ලංකා ආන්ඩුව සහ දෙමළ ඊළම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය 2003 අප්‍රේල් මාසයෙන් පසුව ප්‍රථම වතාවට ජිනීවාහි දී ඊළඟ මස සාකච්ඡා පැවැත්වීමට එකඟ විය.

සාකච්ඡාවල මූලික විෂය වනු ඇත්තේ, 2002 පෙබරවාරියේ දී අත්සන් කරන ලද එහෙත් පසුගිය නොවැම්බරයේ දී මහින්ද රාජපක්ෂ ජනාධිපති ලෙස තේරී පත්වීමෙන් පසුව මුලුමනින් ම පාහේ නොතකා හරින ලද්දක් බවට පත්ව ඇති සටන් විරාමය "ශක්තිමත් කිරීම" යි. පසුගිය මාස දෙක තුල, මිලිටරි භටයන්, එල්ටීටීඊ සාමාජිකයන් සහ සිවිල් වැසියන් ඇතුලු 200කට අධික පිරිසක් රැක සිට කල පහර දීම්, බෝම්බ ප්‍රහාර සහ ඝාතන මාලාවක් මගින් මරා දමනු ලැබ ඇත.

සාම සාකච්ඡා යලි ඇරඹීම පිනිස බල කරනු වස්, නෝර්වේජියානු මැදිහත්කරු එරික් සොල්හයිම් සහ එක්සත් ජනපද සහකාර රාජ්‍ය ලේකම් නිකොලස් බර්න්ස් යන දෙදෙනාම පසුගිය සතියේ ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදුනි. එල්ටීටීඊය ඔස්ලෝ හෝ වෙනත් යුරෝපීය අගනගරයක සාකච්ඡා පැවැත්විය යුතු යැයි ඉල්ලා සිටීමත් රාජපක්ෂ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ආසියානු රටක සාකච්ඡා පැවැත්විය යුතු යැයි අවධාරනය කිරීමත් සමග, සාකච්ඡා පවත්වන ස්ථානය පවා තියුනු මතභේදයට ලක්ව තිබුනි.

ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) සහ ජාතික හෙල උරුමයේ පිටුබලය සහිතව රාජපක්ෂ නොවැම්බර් ජනාධිපතිවරනයෙන් යන්තම් ජය ලැබී ය. මෙම පක්ෂ දෙක ම, රාජපක්ෂ සමග ඇති කර ගත් මැතිවරන ගිවිසුම් මගින් අවධාරනය කොට සිටියේ, මිලිටරියේ තත්වය ශක්තිමත් කරගනු වස් සටන් විරාමය යලි සාකච්ඡා කිරීම සහ මැදිහත්කරුගේ ක්‍රියාකලාපයෙන් නෝර්වේ රාජ්‍යය විස්ථාපනය කිරීම ඇතුලුව එල්ටීටීඊය සම්බන්ධයෙන් තදබල ආස්ථානයක් ගත යුතු බවට යි. නෝර්වේ රට ද විශේෂයෙන් ම සොල්හයිම් ද එල්ටීටීඊය සම්බන්ධයෙන් පක්ෂපාති ලෙස ක්‍රියා කරන බවට හෙල උරුමයත් ජවිපෙත් නැවත නැවතත් චෝදනා කර තිබේ.

දෙපාර්ශ්වය අතර ක්ෂනික එකඟතාවකට ඇති ඉඩකඩ ඉතා අඩු ය. ශ්‍රී ලංකා මිලිටරියට එරෙහි ප්‍රහාර නතර කිරීමට එකඟ වී ඇති අතර ම, එල්ටීටීඊය සටන් විරාම ගිවිසුම යලි කෙටුම්පත් කිරීමකට විරුද්ධව සිටී. දෙමල ජනතාවගේ අභිලාෂයන් සන්තර්පනය කරන් සාධාරන දේශපාලන රාමුවක් යෝජනා කරන ලෙසත් නැතිනම් යලිත් යුද්ධයකට මුහුන දෙන ලෙසත් පසුගිය නොවැම්බරයේ දී එල්ටීටීඊ නායක වී. ප්‍රභාකරන් ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය.

පසුගිය සතියේ *රොයිටර්* ප්‍රවෘත්ති සේවයට කල අදහස් දැක්වීමක දී, සොල්හයිම් අපේක්ෂාවන් පිලිබඳව පරෙස්සම් සහගත විය: "මෙම ක්‍රියාදාමය තුල දී ඉවසීම වැදගත් කරුනක් වූ අතර එය ඉදිරියටත් එසේ ම ය. මෙය මාස කිහිපයක දී විසඳාලිය හැකි දෙයක් නො වේ." යැයි ඔහු ප්‍රකාශ කලේ ය. සාමය සඳහා "උද්යෝගයක් තිබෙන නමුත්, "අවශ්‍ය සම්මුති සඳහා සැබෑ උද්යෝගයක් ඇතැම් විට නො පවතී" යැයි ඔහු පැවසී ය. "ලොකුම අවදානම නම් ප්‍රචන්ඩ ක්‍රියාවන් නිර්මානය කොට මෙම සාධනීය ප්‍රයත්නයට වල කැපීමට අවශ්‍ය කඩාකප්පල්කාරින්" යැයි ඔහු අනතුරු ඇඟවී ය.

එකදු පාර්ශ්වයක් වත් උත්සන්න කෙරෙන ප්‍රචන්ඩ ක්‍රියා සම්බන්ධයෙන් වගකීම භාර ගැනීම ප්‍රතික්ෂේප කරන නමුදු, එල්ටීටීඊය සහ ශ්‍රී ලංකා මිලිටරිය යන දෙගොල්ල ම, ඔවුන්ට අනුබද්ධිත මිලිෂියා කන්ඩායම් හා එක්ව, පසුගිය මාස දෙක තිස්සේ අප්‍රකාශිත යුද්ධයකට සම වන ගැටුමක් නිමග්නව සිටී. මිලිටරි ධූරාවලියේ කොටස් ආරම්භයේ පටන් ම සටන් විරාමයට සතුරු වූ අතර 2003 දී පෙර පැවති සාකච්ඡා බිඳවැටීමට තුඩු දුන් ප්‍රකෝපකරයන් මාලාවක නිරත විය.

එක්සත් සහකාර ලේකම් බර්න්ස් අපක්ෂපාතී බවක් මවාපෙන්වීමේ උත්සාහයක වත් යෙදුනේ නැත. ඔහු

කොලඹ ආන්ඩුවේ "ඉවසීම" ප්‍රශංසාවට ලක් කල අතර "රට යුද්ධයේ මුව විටට තල්ලු කරන" "ගර්හාවට ලක් කල යුතු කන්ඩායමක්" ලෙස එල්ටීටීඊය හංවඩු ගැසී ය. යම් හෙයකින් යලි යුද්ධයක් ඇවිලුන හොත් එහි "පූර්න වගකීම" එල්ටීටීඊය භාර ගත යුතු යැයි ඔහු ප්‍රකාශ කලේ ය. එල්ටීටීඊය සාමය ද නැතිනම් "පසුගිය දශක එකහමාරක කාලය තුල ඔවුන් ගෙන ගිය පිලිකුල් සහගත පිලිවෙත්" තව දුරටත් ඉදිරියට ගෙන යනවා ද යන දෙකෙන් එකක් තෝරා ගත යුතු යැයි ඔහු පැවසී ය.

යලි යුද්ධය ඇවිලුන හොත් විශාල වන්දියක් ගෙවීමට එල්ටීටීඊයට සිදු වනු ඇතැයි, මේ මස මුල දී කොලඹ එක්සත් ජනපද තානාපති ජෙෆ්රි ලන්ස්ටඩ් අනතුරු ඇඟවී ය. මොන යම් හෝ ගැටුමක දී ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන්ට එක්සත් ජනපදයේ ක්‍රියාකාරී පිටුබලය ලැබෙනු ඇතැයි යන්න බලගතු ලෙස අඟවමින් ඔහු කියා සිටියේ, එල්ටීටීඊය මුහුන දෙනු ඇත්තේ "වඩා හැකියාවන්ගෙන් යුක්ත වඩා අධිෂ්ඨානවත් හමුදාවකට" බව යි.

සිය ජාත්‍යන්තර මිලිටරි අධ්‍යාපන සහ පුහුනු වැඩසටහන යටතේ ශ්‍රී ලංකා මිලිටරිය පුහුනු කරනු පිනිස එක්සත් ජනපදය දැනටමත් වාර්ෂිකව ඩොලර් 500,000ක් වැය කරයි. පසුගිය සතියේ පල වූ ඒසියා ටයිම්ස් වාර්තාවකට අනුව, එක්සත් ජනපදය 2004 දී ඩොලර් මිලියන 2.5ක් ද 2005 දී ඩොලර් 496,000ක් ද මේ වසරේ දී ඩොලර් මිලියන 1ක් ද වටිනා නය පහසුකම් ද සන්නද්ධ හමුදාවන්ට සපයා තිබේ.

ඊනියා සාම ක්‍රියාදාමයට සහාය දී ඇති අතර ම, බුෂ් පාලනාධිකාරය පැහැදිලිව ම ගනන් බලන්නේ, යලිත් පූර්න පරිමාන යුද්ධයක් ඇවිලුන හොත් සිය විකල්පයන් කවරේ ද යන වග යි. දිග්ගැසුනු සිවිල් යුද්ධය වසර ගනනාවක් තිස්සේ නොතකා සිටි වොෂිංටනය සම්බන්ධයෙන් ගත හොත් මෙම ගැටුම වනාහි ඉන්දියානු උප-මහාද්වීපය තුල වැඩෙන එක්සත් ජනපද ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන්ට තර්ජනයක් වන අතර එය ඒ හෝ මේ ආකාරයෙන් අවසානයක් කරා ගෙන ආ යුතු ය.

## දේශපාලන ආතතීන්

සාකච්ඡා කොලඹ පාලනයට වාසි සහගත වනු ඇති බවට සහතික කරගනු වස් රාජපක්ෂ එක්සත් ජනපදයේ පිටුබලය මත වාරු වෙයි. එල්ටීටීඊයට හිතැති දෙමල පුවත් පතක් වන සුඩර් ඔලි පත්‍රයේ පසුගිය සඳුදා පල වූ සම්මුඛ සාකච්ඡාවක දී ඔහු සාකච්ඡාවන්ට එකඟ වන ලෙස එල්ටීටීඊයෙන් ඉල්ලා සිටියේ ය. "මාව විශ්වාස කරන්න. මම දෙමල ජනතාව සම්බන්ධයෙන් අවංක වීමට කැමැත්තෙමි. සාමය අත්පත් කර ගැනීමේ අවස්ථාව මට ලබා දෙන්න. මා සමග සහයෝගයෙන් කටයුතු කොට මා යථාර්ථවාදියෙකු බව ඔබට ඔප්පු කිරීමට මට ඉඩ දෙන්න." යනුවෙන් ඔහු පුවත් පතට පැවසී ය.

ජනාධිපති එකිනෙක සමග ගැටෙන පීඩනයන්ට මුහුන දී සිටී. කොලඹ සංගත ප්‍රභූන්ට අවශ්‍ය වන්නේ, විදේශ ආයෝජන ලබා ගැනීමට ද දිවයින භූගෝලීයකෘත නිෂ්පාදන ක්‍රියාදාමයට ඒකාග්‍ර කිරීමට ද බාධාවක් බවට පත්ව ඇති යුද්ධය අවසන් කිරීමට යි. සාම සාකච්ඡා පිලිබඳ ප්‍රවෘත්තියෙන් අනතුරුව පසුගිය බ්‍රහස්පතින්දා කොලඹ කොටස් වෙලඳ පොල එක් දිනක් තුල පැවති සිය ඉහල ම නැග්ම වන සියයට 7කට වැඩි වර්ධනයක් වාර්තා කලේ ය. ලංකා වෙලඳ මන්ඩලයේ සභාපති දේවා රැද්ගු "සැලකිය යුතු කාලයකට මට අසන්ට ලැබුනු හොඳම ප්‍රවෘත්තිය" ලෙස සාකච්ඡා උද්යෝගිමත්ව ප්‍රශංසාවට ලක් කලේ ය.

එමෙන් ම, සිය අස්ථාවර සුලුතර ආන්ඩුවේ මුක්කු ලෙස ජවිපෙ සහ හෙල උරුමයේ සහයෝගය මත ද රාජපක්ෂ යැපෙයි. හෙල උරුමයේ ලේකම් චම්පික රනවක සාකච්ඡා ජිනීවාහි පැවැත්වීමට සිය විරුද්ධත්වය ක්ෂනිකව ම ප්‍රකාශයට පත් කලේ, ස්ථානය "එල්ටීටීඊයට යුක්තියුක්ත භාවයේ භූගෝලීය මුද්‍රාව ලබා දෙනු ඇත" යැයි පවසමිනි. "ආන්ඩුව සහ එල්ටීටීඊය සම හවුල්කරුවන් ලෙස හඳුනා ගැනෙනු ඇත. සාකච්ඡා නීතියුක්ත ආන්ඩුවක් හා ත්‍රස්තවාදීන් කන්ඩායමක් අතර පැවැත්වෙන සාකච්ඡා ලෙස නො දකිනු ඇත." යැයි ඔහු කීය.

පසුගිය අඟහරුවාදා, එනම් සාකච්ඡා පිලිබඳව නිවේදනය කිරීමට යන්තම් දිනකට පෙර, හෙල උරුමයට අනුබද්ධිත ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරය, බින් ලාඩන්ගේ රූපය සමග එක පෙලට ප්‍රභාකරන්ගේ රූපය ද සහිතව, කොලඹ පුරා පෝස්ටර් අලවා තිබුනේ එල්ටීටීඊයට එරෙහිව මිලිටරිමය ලෙස ක්‍රියා කරන ලෙස එක්සත් ජනපදයෙන් ඉල්ලා සිටිමිනි. "ඔව්, බර්න්ස් මහතානනි, ත්‍රස්තවාදයට ඇත්තේ එකම පිලිතුරකි" යැයි එය ප්‍රකාශ කලේ ය.

ජවිපෙ නායකත්වයෙන් යුත් දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය එල්ටීටීඊයේ ඝාතන නතර කිරීමටත් සටන් විරාමය සංශෝධනය කිරීමටත් ආන්ඩුවට බල කිරීමේ සිය උද්ඝෝෂන ව්‍යාපාර දිගට ම පවත්වා ගෙන යයි. බීබීසී ප්‍රවෘත්ති සේවයට කතා කරමින් ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී නන්දන ගුනතිලක අවධාරනය කලේ, එල්ටීටීඊය සමග ඇති කර ගැනෙන මොන යම් හෝ සාම සම්මුතියක් "ඒකීය රාජ්‍ය ව්‍යුහය" මත පාදක විය යුතු බව යි. ජවිපෙ සමග ඇති කර ගැනුනු සිය මැතිවරන ගිවිසුමේ කොටසක් ලෙස රාජපක්ෂ මෙම ඉල්ලීමට එකඟ වී තිබුනි.

රාජපක්ෂට උපාමාරු දැමීමට ඉඩක් නැති තරම් ය. සිංහල ස්වොත්තමවාදයේ සංකේත භාෂාවෙන් ගත් කල, "ඒකීය රාජ්‍යය" සඳහා සහයෝගය යන්නෙන් අදහස් කෙරෙන්නේ රාජ්‍ය ආගම ලෙස බුද්ධාගම සමග සිංහල බහුතරයේ දේශපාලන අධිපති භාවය පවත්වා ගෙන යාම යි. ඒකීය රාජ්‍යය මත පාදකව සාකච්ඡා සඳහා සහයෝගය දීම මගින් රාජපක්ෂ, යුද්ධයට විසඳුමක් ලෙස මීට පෙර එකඟ වූ පදනම -- එනම්, දිවයිනේ උතුරේ හා නැගෙනහිර දෙමල සුලුතරයට සැලකිය යුතු ස්වයං-පාලනයක් සඳහා ඉඩ දෙන ෆෙඩරල් රාජ්‍යයක් -- තථ්‍ය ලෙස ප්‍රතික්ෂේප කලේ ය.

සිංහල වර්ගෝත්තමවාදයේ කර වටක් ගිලී ඇති මිලිටරියේ ඉහල කොටස්වලින් එල්ල වන විරුද්ධත්වයට ද රාජපක්ෂ මුහුන දී සිටී. ඔහු තේරී පත් වීමෙන් ඉතා සුලු කලක දී, සන්නද්ධ හමුදා, සටන් විරාමය සංශෝධනය කරනු පිනිස ජනාධිපතිට යෝජනා ලැයිස්තුවක් ම ඉදිරිපත් කලහ. සටන් විරාමය කෙටුම් පත් කරනු ලැබ තිබුනේ එල්ටීටීඊයට ගැලපෙන අයුරින් බවත් වර්තමානයේ සාම සාකච්ඡා සඳහා කිසිදු පදනමක් නැති බවත්, හමුදාපති ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කලේ ය.

පසුගිය බ්‍රහස්පතින්දා පැවති පාසල් උත්සවයක කතා කරමින්, ෆොන්සේකා කියා සිටියේ සන්නද්ධ හමුදාවන් "ගෞරවනීය සාමයක්" අත්පත් කර ගන්නා බව යි. මෙහි අදහස විය හැක්කේ එල්ටීටීඊයේ පරිපූර්න යටත් වීමක් පමනි. ඔහුගේ ප්‍රකාශය, හමුදාව ජිනීවා සාකච්ඡා නොතකා හැරීමට හෝ ඒවාට වල කැපීමට හෝ ක්‍රියා කරතැයි යන වගට කල එතරම් සූක්ෂ්ම නො වන ආකාරයේ ඇඟවුමකි.

එදින ම, මඩකලපුවේ එල්ටීටීඊ දේශපාලන අංශ නායක මේජර් කපිලන්, නාඳුනන ඝාතකයන් විසින් මග රැක සිට මරා දමන ලදි. එල්ටීටීඊය මිලිටරියටත් එය සමග සහයෝගීව ක්‍රියා කරන පැරා-මිලිටරි කන්ඩායම්වලටත් දොස් පැවරූ අතර, කොලඹ ආන්ඩුව "ද්විත්ව රංගනයක" යෙදී සිටින බවට ද චෝදනා කලේ ය. මිලිටරිය ප්‍රතිචාර දක්වූයේ, මඩකලපුව අසල බන්කරයකට රොකට් විදිනයකින් ග්‍රෙනේඩ් බෝම්බයක් විද්ද බවට එල්ටීටීඊයට චෝදනා කරමිනි.

අඟහරුවාදා සුඩර් ඔලි පත්‍රයේ ත්‍රිකුනාමල වාර්තාකරු සුබ්‍රමනියම් සුගිර්ධරාජන් වෙඩි තබා ඝාතනය කෙරුනි. ඊට පෙර දින ඔහු ශ්‍රී ලංකා මිලිටරිය සමග සහයෝගීව ක්‍රියා කරන පැරා මිලිටරි කන්ඩායම්වල ක්‍රියාකාරකම් පිලිබඳව ලියා තිබුනි. මෙම ඝාතනය, ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුවේ ප්‍රධානි හැගර්ප් හෝක්ලන්ඩ් මෙසේ ප්‍රකාශ කිරීමට පෙලඹවී යː "මේක නම් පිස්සුවක්. යුද්ධය හැර අන් කිසිවක් අවශ්‍ය නැති පාර්ශ්වයන් මේ රටේ සිටී."

රාජපක්ෂ, මිලිටරිය ජිනීවා සාකච්ඡා කඩාකප්පල් කිරීමට ඉඩ ඇතැයි යන්න පිලිබඳව පැහැදිලිව ම උත්සුකව, අඟහරුවාදා ආරක්ෂක හමුදා හා පොලිස් ප්‍රධානින්ගේ හදිසි ඉහල පෙලේ රැස්වීමක් කැඳවී ය. ප්‍රවෘත්ති වාර්තාවන්ට අනුව, ජනාධිපති ආරක්ෂක හමුදා නායකයන්ට උපදෙස් දුන්නේ, "සාම ක්‍රියාදාමයේ අර්ථාන්විත හා ඵලදායි ප්‍රගතියට බාධා කරන මොනම ආකාරයක වත් වැරදි ක්‍රියාවන්ට ඉඩ නොදෙන්" ලෙස යි.

ඊයේ සන්ඩේ ටයිම්ස් පත්‍රයේ "තත්ව වාර්තාව" මෙම රැස්වීම වඩා ඍජු වචනවලින් විස්තර කලේ ය. රාජපක්ෂ එහි සිටි අයට කියා සිටියේ "ඔවුන්ගේ ප්‍රධාන වගකීම වන්නේ මිලිටරි භටයන් එල්ටීටීඊයට එරෙහි කිසිදු ප්‍රහාරාත්මක ක්‍රියාවක නොයෙදන බවට සහතික කර ගැනීම" බව යි." ඔවුන් ආන්ඩුවේ සාම ප්‍රයත්නයන්ට බැඳී සිටිය යුතු යැයි ඔහු පැවසී ය. දේශපාලනිකව මෙහෙයවෙන කොටස් විසින් දරෙන කඩාකප්පල්කාරි ප්‍රයත්නයන් පිලිබඳව දැනුවත්ව සිට ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතු යැයි ඔවුන්ට අනතුරු අඟවන ලදි.

සිකුරාදා මඩකලපුවට ගුවනින් යන ලෙස රාජපක්ෂ ආරක්ෂක මාන්ඩලික ප්‍රධානි අද්මිරාල් දයා සඳගිරිටත් හමුදාපති ෆොන්සේකාටත් අන කලේ ය. සන්ඩේ ටයිම්ස් පත්‍රයට අනුව, "නව සාම ප්‍රයත්නය ගැනත් කිසිදු ප්‍රකෝපකාරී ක්‍රියාවක යෙදීමෙන් තොර වාතාවරනයක් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව ගැනත් ඔවුහු මිලිටරි භටයන්ට කතා කලේ ය." වෙනත් වචනවලින් කිය තොත්, මිලිටරිය ඒ ගැන කරන සියලු ප්‍රතික්ෂේප කිරීම් තිබිය දී ම, එය මෑත මාස ගනනාව තිස්සේ යෙදී ගෙන සිටියේ හරියට ම එම කටයුත්තේ ය.

සාකච්ඡා පැවැත්වුනා වුවත්, ජිනිවාහි දී මොන යම් හෝ එකඟතාවක් ඇති කර ගැනීමට හැකි වේ ද යන්න තවමත් විවෘත ප්‍රශ්නයකි.

© www.wsws.org